සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටුව
சிறைக்கைதிகளின் உரிமைகளை பாதுகாக்கும் குழு
COMMITTEE FOR PROTECTING RIGHTS OF PRISONERS

2021.05.17

සභාපති
ජාතික පොලිස් කොමිෂන් සභාව,
කොළඹ.

ගරු සභාපතිතුමනි,

**<u>නිලයේ වගකීම් පැහැරහරිමින් මනුෂ්‍ය ඝාතනයක් සඳහා ආධාර අනුබල ලබාදීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට එරෙහිව ඉදිරිපත් කරන පැමිණිල්ලයි</u>**

ශ්‍රී ලංකාවේ සියළුම පුරවැසියන්ගේ අපරාධ විමර්ශකයා වශයෙන් ශ්‍රී ලංකා පොලිසිය කටයුතු කරනු ලබයි. ඒ අනුව මෙකී අපරාධ විමර්ශන කාර්යයන් විධිමත්ව සහ කාර්යක්ෂමව කරගෙන යාම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, පොලිස් ආඥා පනත ඇතුළු අනෙකුත් ව්‍යවස්ථාපිත නීති මගින් ශ්‍රී ලංකා පොලිසියට බලය ලබාදී තිබේ. ඒ අනුව සිදු වීමට ඉඩ තිබෙන අපරාධයක් හෝ සිදු වූ අපරාධයක් සම්බන්ධයෙන් මුල් තොරතුරක් හෝ පැමිණිල්ලක් ලැබුණු විට එකී සිද්ධිය හෝ අදාල තොරතුර සම්බන්ධයෙන් අවධානය යොමු කර ඉක්මණින් හා උද්යෝගයෙන් යුතුව කටයුතු කළ යුතු වේ. ඒ අනුව කිසිදු බේදයක් හෝ වෙනසක් නොමැතිව සියළු පුරවැසියන්ගේ ජීවිත ආරක්ෂා කිරීමේ වැදගත්කම නිසාම ශ්‍රී ලංකා පොලිසිය වෙත අපරාධ විමර්ශන සම්බන්ධයෙන් විශාල අභිමතයක් ලබාදී තිබෙන බැවින්, එය ක්‍රියාවේ යෙදවීම ප්‍රවේශමෙන් කළ යුතු වේ.

ඒ අනුව පසුගිය 2021.05.12 වන දින නීතිඥ අනෝජ් හෙට්ටිආරච්චි විසින් පොලිස්පතිතුමා වෙත ලිපියකින් ඉල්ලා ඇත්තේ රුඳවුම් නියෝග මත පොලිසිය භාරයේ සිටින තාරක ධර්මකීර්ති විජේසේකර නමැති සැකකරුට එල්ල වී ඇති ජීවිත තර්ජන සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසයි. එසේම ඉහත කී 2021.05.12 වන දිනදීම පොලිස්පතිවරයා යටතේ ක්‍රියාත්මක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් පෑලියගොඩ විශේෂ අපරාධ විමර්ශන ඒකකයටත් ඉහත කී සැකකරුට ජීවිත තර්ජන එල්ල වී ඇති බවත්, ඔහු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත්, නීතිඥ අනෝජ් හෙට්ටිආරච්චි මහතා විසින්ම ලිඛිතව ඉල්ලීම් කර ඇත. එසේ තිබියදී මෙකී සැකකරු එදින රාත්‍රියේදී මීරිගම ප්‍රදේශයේදී

Reg. No :GL 00211612
No. 188, Hulftsdorp Street, Colombo 12, Sri Lanka
Tel : +94 71 4453890 / +94 71 4253518 / +94 77 2817164 / +94 77 0869675
Email : cprporg@gmail.com Web : www.cprp27.com

ඝාතනය වී ඇත. විමර්ශන කටයුත්තක් සඳහා ගෙනගොස් සිටින විට මෙකී සැකකරු විසින් පොලිසියට ප්‍රහාරයක් එල්ල කිරීමට යාමේදී සිදු කළ ප්‍රතිප්‍රහාරයෙන් ඔහු මියගොස් ඇති බව පසුව නිල වශයෙන් දැනුම් දී තිබුණි. මෙම කරුණු මොනතරම් දුරට සත්‍යයද, අසත්‍යයද යන්න මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඉදිරි විමර්ශනවලදී තහවුරු වන්නකි.

කෙසේ වුවද, මෙම ඝාතනය වූ සැකකරුගේ ජීවිත අවධානම සම්බන්ධයෙන් සොයා බලන ලෙසට ඝාතනය වීමට පැය කිහිපයකට පෙර සිටම දැනුම් දී තිබියදී පොලිස්පතිවරයා විසින් කිසිදු සොයාබැලීමක් හෝ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර, ඔහු තමන්ගේ නිල බලය අනුව කටයුතු නොකලේ ඇයිද යන්න ගැටළුවකි. ඒ අනුව එමගින් මෙම මනුෂ්‍ය ඝාතනය සඳහා ඔහුගේ ආධාර සහ අනුබලය ලැබී ඇති බව සාධාරණව බැලීමේදී පැහැදිලි වේ. එසේම, ඉහත කී නීතිඥ අනෝජ් හෙට්ටිආරච්චි මහතාගේ 2021.05.12 දිනැති ලිපිය සම්බන්ධයෙන් තමා විසින් ගත් පියවර මොනවාද යන්න පැහැදිලි කිරීමක් හෝ මේ දක්වා ඔහු විසින් සිදු කර නොමැත.

එසේම පොලිස්පතිවරයා විසින් මේ ආකාරයට තමන්ගේ වගකීම් පැහැරහරිමින් ක්‍රියා කරන්නේ නම්, එමගින් ශ්‍රී ලංකා පොලිසිය සම්බන්ධයෙන් පුරවැසියන් තුළ බරපතල අවිශ්වාසයක් ඇතිවන බවත්, ඒ නිසාම පුරවැසියන් අනාරක්ෂිත තත්ත්වයකට පත්වන බවත් ඔබ කොමිෂම වෙත පෙන්වා දෙනු කැමැත්තෙමි. එබැවින්, පොලිස්පතිවරයාගේ මෙම අනීතික රාජකාරී නොකරහැරීම සම්බන්ධයෙන් ඉක්මන් පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය නෛතික පියවර ගන්නා මෙන් අප සංවිධානය ඉල්ලා සිටිමු. තවද, ඉහත කී 2021.05.12 දිනැතිව අනෝජ් හෙට්ටිආරච්චි මහතා විසින් පොලිස්පතිවරයාට යොමු කළ ලිපියේ පිටපතක් මේ සමග ඉදිරිපත් කර සිටිමු.

මෙයට,

නීතිඥ සේනක පෙරේරා
සභාපති

Committee for Protecting Rights of Prisoners
No,188,Hulftsdorp Street,
Colombo 12.
Reg. No. 00211612

ANOJ HETTIARACHCHI

Attorney at law

2021.05.12

පොලිස්පති තුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ

මහත්මයාණෙනි,

<u>රැඳවුම් නියෝග මත ඇති රැඳවියෙකු සම්බන්ධවයි.</u>

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මහජන පැමිණිලි අංශයේ රැඳවුම් නියෝග මත රඳවා සිටින ලද තාරක ධර්මකීර්ති විජේසේකර යන සැකකරුගේ මව වන අගම්පොඩි ජානකී ද සොයිසා යන කැතැන්තියගේ උපදෙස් පිට මෙම ලිපිය ඔබතුමාට යොමු කරන බව සලකන්න.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මහජන පැමිණිලි අංශයේ රඳවා සිටි ඉහත නම් සඳහන් සැකකරු මේ වන විට පෑලියගොඩ විශේෂ අපරාධ විමර්ශණ ඒකකයට භාරදුන් බවට මා දුරකථනය මාර්ගයෙන් කරන ලද විමසීමකදී මා හට දැනගන්නට ලැබුණි.

මෙම සැකකරුගේ ජීවිතයට නොයෙකුත් තර්ජන එල්ල වී ඇති බව අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම් සභාවටත් ගරු අධිකරණයටත් සැලකර සිටින ලද කරුණකි.

සැකකරුගේ පූර්ණ භාරකාරීත්වය මේ වන විට හිමි වී ඇත්තේ ඔබතුමන්ගේ දෙපාර්තමේන්තුවේ අදාළ ඒකකය වෙතය.

කරුණු එසේ හෙයින් උක්ත කාරණය පිළිබඳව ගෞරවනීය අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

ස්තූතියි

මීට

නීතිඥ

පිටපත්

ගරු නීතිපතිතුමා, නීතිපති දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂක, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

නියෝජ්‍ය පොලිස්පති. නීතිඥ අජිත් රෝහණ මහතා

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ස්ථානාධිපති, විශේෂ විමර්ශන ඒකකය

Anoj Hett...chc...
Attorney-at-Law
Commissioner for Oaths &
Registered Company Secretary
Chambers : 30/14,
...chiarachchi Watte, Colombo 12.
High Court, Hulftsdrop
Residence ...
Elde...